**බෞද්ධයා සරණගියේ නිගණ්ඨ ධර්මය ද?**

කෙළෙස් ගින්නෙන් නිරන්තරයෙන් දැවෙමින් ගිනි ගනිමින්, නැවත නැවත ඉපදෙමින් මැරෙමින්, සසරක් පිළිබඳ අංශු මාත්‍රයක වැටහීමක් නො මැතිව ඉබාගාතේ යමින්, අග මුල පටලවා ගත් ලෝ සතුන් කෙරෙහි පතල මහා කරුණාවෙන් තෙත් වූ ලයැති ඒ මහා බෝධිසත්ත්වයන් වහන්සේ සුමේධ තාපස ව ඉපිද අෂ්ඨ ධම්ම සමන්නාගතව අෂ්ඨ සමාපත්ති පඤ්ච අභිඥාවන් ගෙන් විරාජමානව සතර පද ගාථාවක සතරවන පදය ශ්‍රවණය වන්නටත් පෙර සව් කෙළෙසුන් නසා අරහත්වය ශාක්ෂාත් කොට සියලු දුක් කෙළවර කොට ගත හැකිව තිබිය දී **මේ හුදෙකලා නිවණින් කම් නැත, අන්‍ය සත්ත්වයන් එතෙර කරවා ගෙන මමත් එතෙර වන්නෙමි** යි අධිෂ්ඨාන කොට අතට ලැබුනු නිවණ අත හැර, සංසාරය නමැති ගින්නෙහි භයංකර බව දැන දැන ම සසර ගින්නට පැන එතැන් පටන් සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් සමතිස් පැරුම් දම් පුරමින් උතුම් වූ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කොට වදාළේ ලෝ සතුන් භයංකර වූ කෙළෙස් ගින්නෙන් මුදවා එතෙර කරවීමට අවශ්‍ය කරන්නා වූ උතුම් වූ චතුරාර්ය සත්‍යය නම් වන මාර්ගෝපදේශකත්වය තුන් ලොවට ම විවෘත කරවමිනි.

එසේ දීපංකර පාදමූලයේදී මහා අභිනීහාරය පැවැත්වූ තැන් පටන් ඉපදුනු යම් ජීවිතයක් ඇත්ද, තැබූ යම් පියවරක් ඇත්ද, හෙළුවා වූ හුස්මක් ඇත්ද ඒ සියල්ලක් ම සියළු සතුන් දුකින් මුදවමි යි යන චේතනාභිලාෂයෙන් ප්‍රතිමණ්ඩිතව ම වූහ. ඒ එසේ නො වන්නට අද අපට ද අඳුරේ ම ඉපිද අඳුරේ ම මියැදෙනවා හැරෙන්නට කථා කරන්නට, හැසිරෙන්නට ධර්මයක් නැත.

ඒ අමා මෑණී බුදුපියාණන් වහන්සේ ලොවට හෙළිකොට වදාළ මනුෂ්‍යත්වයේ මඟ වර්තමානය වන විට බෞද්ධ යැයි කියාගන්නා පින්වතුන් කොතෙක් නිවැරදිව හඳුනාගෙන ඇත්දැයි විමසා බැලීමේ දී පෙනී යන්නේ බොහෝ පින්වතුන් බුදුන් වහන්සේ ගේ ධර්මය නොව නිගණ්ඨනාථපුත්ත ගේ දහම සරණ ගිය බවකි.

එදා බුදුන් දවස උපාලි ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ වාදයකට ප්‍රවේශවෙමින් (වැඩි විස්තර දනු කැමතියෝ මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රය කියවත්වා) කර්මය පිළිබඳ නිගණ්ඨ දහම දිගහරින්නට විය. එනම් කාය වාක් මනෝ කර්මයන් අතුරෙන් කාය කර්මය අන් සියල්ලට ප්‍රමුඛත්වය දෙන බවයි. භාග්‍යවතුන් වහන්සේ වදාළේ මනෝ කර්මය අනෙකුත් කර්මයන් ට මූලිකත්වය දෙන බවයි.

වර්තමානය වන විට බෞද්ධ යැයි කියාගන්නා බොහෝ පින්වතුන් ගේ චින්තන රටාව සකස් වී ඇත්තේ ත් ඒ නිගණ්ඨ දහම මූලබීජය කොට ගෙන ම නො වේද?

යමෙක් අතින් වරදක් වූ විට, අපරාධයක් වූ විට, අකටයුතුකමක් සිදු වූ විට කිසිවක් ම නො විමසා ඒ දෙසට ම ඇඟිල්ල දිගු කොට දඬුවම් කරන්නට පනිති. තර්ජනය කරති. වාද විවාද කරති. උද්ඝෝෂණ කරති. පෙලපාළි යති. වැරදි කළවුන් දෙස බල බලා දත් විකති. දඬුවම් දෙන්නට ම උත්සාහ කරති. කොටින්ම කියතොත් අනෙකා ගේ වැරදි තමන්ගේ මල්ලෙහි ඔබා ගනිති. ඊට හේතුව කුමක්ද?

ලෝකය හදන්නට දඟලන විට තමාගේ මනස ට සිද්ධ වන්නා වූ විපර්යාසය ගැන ඇති අනවබෝධයයි. අනෙකා ගේ අපරාධයන් දැක දැක තමාගේ මනසට ඊට වැඩි හාණියක් කරගන්නට තරම් හැඟීම්බර වෙති. අපරාධය කළවුන් කළ පමණින් එය අවසන් කරති. එනම් කාය කර්මයෙන් නවතිති. එහෙත් ඒ දෙස බලා එයට ශාප කරන අන්ධ බාලයා නැවත නැවතත්, නැවත නැවතත් එය මෙනෙහි කරමින් නැවත නැවත ද තමාම කෙළෙසෙති.

දිසෝ දිසං යං තං කයිරා - වේරී වා පන වේරිනං

මිච්ඡා පණිහිතං චිත්තං - පාපියෝ නං තතෝ කරේ

(ධම්ම පදය - චිත්ත වග්ගය)

සොරෙක් සොරෙකුට හෝ වෛරී පුද්ගලයෙක් වෛරී පුද්ගලයෙකුට යම් නපුරක් කරයි ද ඊට වැඩි නපුරක් වරදෙහි පිහිටුවා ගත් සිත තමාට කරන්නේය.

මේ පිළිබඳ වගේ වගක් නැති ඇත්තෝ අශූචියෙන් අනෙකාට දමා ගසන්නට දිවිහිමියෙන් ම කැප වෙති. අනෙකාට ගසන්නට පෙර තමා ගේ අතෙහි අශූචි තැවරෙන බව පිළිබඳ සංඥා මාත්‍රයක් වත් නො හඟිති. කාය කර්මය ම අග්‍ර කොට ගනිති. අපරාධකරුවෙකු ගේ වුව ද මනස වෙනස් කිරීමට දායක වීම තුලින් එවන් අපරාධයන් නැවත සිදු නොවන්නට කටයුතු කළ හැකි බව ද, මෙවන් චින්තනයක් තුලින් තමන් ගේ මනසට තමා ම හානි කරගන්නා බව ද, වටහා නො ගනිති. චේතනාහං භික්ඛවේ කම්මං වදාමි යි කටපාඩමින් දොඩවති. එහෙත් තමන් ගේ චේතනාව තමන්ගේ ම කර්මය එසේ සකස් කරන බව පිළිබඳ තැකීමක් නො කරති.

ලොවෙහි යමක් සිදු වූ විට අප ගේ චින්තනය ක්‍රියාත්මක වන්නේ එසේ අපට ම හානිකරව නම් අප කාගේ ශ්‍රාවකයන් දැයි නැවත විමසා බැලීම වටී.

අත්තාන මේ ව පඨමං - පතිරූපේ නිවේසයේ

අථඤ්ඤ මනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ

(ධම්ම පදය - අත්ත වග්ගය)

ලෝකය නිවැරදි කරන්නට ප්‍රථමයෙන් තමා නිවැරදි විය යුතුය. එසේ නිවැරදි වූ තැනැත්තා ම අනුන්ට අනුශාසනා කරන්නට සුදුසු වන්නේ ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළේ එහෙයිනි.

තමාගේ මනසට වත් සාධාරණයක් ඉෂ්ඨකර ගන්නට අසමත් වූ බාලයා කෙසේ නම් ලෝකයට අර්ථයක් සිද්ධ කරන්නටද?

මෙයට

සසුන් ලැදි - බණමඩුව